# නිතර අසනු ලබන ප්‍රශ්න
# ප්‍රත්‍යකෙ ශිෂ්‍ය වාර්තා

NAPLAN

2021

NAPLAN (නැප්ලැන්) යනු සෑම වසරකම මැයි මාසයේ දී 3, 5, 7 සහ 9 වසරවල සිසුන් පෙනී සිටින ජාතික මට්ටමෙන් සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය ඇගයීමේ පරීක්ෂණයකි. සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධ කුසලතා සියලු ඉගෙනුම් කටයුතු සඳහා තීරණාත්මක පදනම වේ. සියලුම ඕස්ට්‍රේලියානු දරුවන්ට පෙනී සිටිය හැකි එකම ජාතික ඇගයීම් පරීක්ෂණය වනුයේ NAPLAN පරීක්ෂණය ය. ඉංග්‍රීසි සහ ගණිතය පිළිබඳව ඕස්ට්‍රේලියානු විෂය මාලාවට සම්බන්ධ අන්තර්ගතය ප්‍රශ්න මගින් මෙහිදී ඇගයීමට ලක් කරයි.

NAPLAN ප්‍රතිඵල මගින් දෙමව්පියන්ට / රැකබලා ගන්නන්ට සහ අධ්‍යාපකයින්ට කාලයත් සමඟ සිසුන් - තනි තනිව, ඔවුන්ගේ පාසල් ප්‍රජාවේ කොටසක් ලෙස, සහ ජාතික ප්‍රමිතීන්ට සංසන්දනාත්මකව - සාක්ෂරතාවයේ හා අංක ශාස්ත්‍රයේ ප්‍රගතියක් ලබන්නේ කෙසේද යන්න දැක ගැනීමට ඉඩ සලසයි.

NAPLAN පරීක්ෂණ යනු එක් එක් පාසලේ ඇගයීම් සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් වන අතර, ඒවා මගින් ගුරුවරුන් විසින් එක් එක් ශිෂ්‍යයාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කරනු ලබන පුළුල්, අඛණ්ඩ ඇගයීම් ප්‍රතිස්ථාපනය නොකරයි. ඔබේ දරුවාගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳ හොඳම අවබෝධය ඔබේ දරුවාගේ ගුරුවරයාට ඇත. වෙනත් පාසල් ඇගයීම් වාර්තා සමඟ, ඔබේ දරුවාගේ හැකියාවන් සහ වැඩිදියුණු කළ යුතු අංශ පිළිබඳව ඔවුන්ගේ ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීමට NAPLAN වාර්තා භාවිතා කළ හැකිය.

## මගේ දරුවාගේ NAPLAN වාර්තාව මට ලැබෙන්නේ කවදා ද, එමගින් මා හට පවසන්නේ කුමක් ද?

ඔබ මේ වසරේ මැයි මාසයේදී NAPLAN පරීක්ෂණවලට සහභාගි වූ ශිෂ්‍යයෙකුගේ දෙමාපියෙක් / රැකබලා ගන්නෙක් නම්, ඔබේ දරුවාගේ පාසල ඔබේ දරුවාගේ ප්‍රතිඵල වාර්තාවක් ඔබට ලබා දෙනු ඇත.

NAPLAN ප්‍රත්‍යෙක ශිෂ්‍ය වාර්තා ප්‍රාන්ත සහ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන බලධාරීන් (www.nap.edu.au/taa) විසින් පාසල් වෙත ලබා දීමෙන් පසුව, ඔබේ දරුවාගේ NAPLAN වාර්තාව අගෝස්තු මාසයේ හෝ ඉන්පසුව ලැබෙනු ඇතැයි ඔබට අපේක්ෂා කළ හැකිය.

කියවීම, ලිවීම, අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ හා විරාම ලකුණු, සහ අංක ශාස්ත්‍රය සඳහා ඔබේ දරුවාගේ NAPLAN ප්‍රතිඵල පෙන්නුම් කරන සාධන පරිමාණ පහක් (හෝ ‘rocket ships’) ඔබට දැකීමට පුළුවන.

3, 5, 7 සහ 9 වසරවල සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය පිළිබඳ ඇගයීම් ප්‍රතිඵල 1 වැනි කලාපයේ සිට 10 වැනි කලාපය දක්වා පරිමාණයකින් වාර්තා වේ. ඇගයීම් මගින් පෙන්නුම් කරන දැනුම, අවබෝධය සහ කුසලතා වර්ධනය වීමේ මට්ටම් මෙම පරිමාණය නියෝජනය කරයි.

## NAPLAN පරීක්ෂණය පාසල්වල පවත්වන්නේ කෙසේද?

2022 වසර වන විට සියලුම පාසල් කඩදාසි භාවිතයේ සිට මාර්ගගතව පරීක්ෂණ පැවැත්වීමේ වෙනස්වීමක් අරමුණු කරගනිමින්, NAPLAN පරීක්ෂණය මාර්ගගතව පවත්වනු ඇත.

මෙයින් අදහස් කරන්නේ 2021 වසරේ මැයි මාසයේදී සමහර සිසුන් කඩදාසි භාවිතයෙන් NAPLAN පරීක්ෂණයට පෙනී සිටින අතර අනෙක් සිසුන් පරීක්ෂණට මාර්ගගතව පෙනී සිටින බවය.

මාර්ගගතව පවත්වන NAPLAN පරීක්ෂණය වඩා හොඳ ඇගයීමක් හා  වඩාත් නිවැරදි ප්‍රතිඵල ලබා දෙන අතර එය සිසුන් සඳහා වඩාත් ආකර්ශනීය වේ.

## වාර්තාව මා කියවිය යුත්තේ කෙසේද?

එක් එක් rocket ship පරිමාණය යටතේ, ඔබේ දරුවා එක් එක් ඇගයීම් මාර්ගගතව හෝ කඩදාසි භාවිතයෙන් සම්පූර්ණ කර ඇත්දැයි සඳහන් කරන ප්‍රකාශයක් අඩංගු වේ. සියලු 3 වසර සිසුන් කඩදාසි භාවිතයෙන් ලිවීමේ පරීක්ෂණය සම්පූර්ණ කරති.

සිසුන් මාර්ගගතව හෝ කඩදාසි භාවිතයෙන් පරීක්ෂණය සම්පූර්ණ කළේද යන්න නොතකා:

- විෂයමාලා අන්තර්ගතය තුළින් උගන්වනු ලබන එකම අධස්ත සාක්ෂරතා සහ අංක ශාස්ත්‍ර කුසලතා මත සිසුන් ඇගයීමට ලක් කරනු ලැබේ
- ආකෘති දෙකේම ප්‍රතිඵල සැසඳිය හැකි පරිදි, සිසුන්ගේ ප්‍රතිඵල නොකඩවා එක හා සමාන  NAPLAN ඇගයීම් පරිමාණයන්ට සංසන්දනාත්මකව මනිනු ලැබේ.

NAPLAN පරීක්ෂණය කාලයත් සමඟ ශිෂ්‍යයෙකුගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රයෝජනවත් ප්‍රතිවේධයන් ලබා දිය හැකි වටිනා මෙවලමකි. නමුත් ප්‍රත්‍යෙක වාර්තා මගින් පරීක්ෂණ දිනයේ දී ශිෂ්‍යයාගේ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරන බැවින්, ඒවා ප්‍රවේශමෙන් අර්ථ නිරූපණය කළ යුතුය.

ශිෂ්‍ය වාර්තාවේ දැක්වෙන්නේ එක් එක් වසර සඳහා වඩාත්ම අදාළවන කලාප හයක් පමණි. 3 වසර වාර්තාවෙන් 1–6 කලාප, 5 වසර වාර්තාවෙන් 3–8 කලාප, 7 වසර වාර්තාවෙන් 4–9 කලාප, සහ  9 වසර වාර්තාවෙන් 5-10 කලාප ද පෙන්වයි. ශිෂ්‍ය වාර්තාවේ රූප සටහන් වලින් පෙන්නුම් කරන්නේ සිසුන්ගෙන් මැදි සියයට 60 සඳහා වන පරාසය, ජාතික මාධ්‍යක ප්‍රතිඵලය සහ එක් එක් වසර මට්ටමේ ජාතික අවම ප්‍රමිතියයි. සමහර ප්‍රාන්තවල සහ ප්‍රදේශවල වාර්තා මගින් ද පාසලේ සහ / හෝ ප්‍රාන්තයේ මධ්‍යකය පෙන්නුම් කරයි. එක් එක් කලාපයේ ඇගයීම් වලදී සිසුන් සාමාන්‍යයෙන් පෙන්නුම් කර ඇති කුසලතාවන් ද වාර්තාව සම්පිණ්ඩනය කරයි.

## NAPLAN පරීක්ෂණය මගේ දරුවට උපකාරී වන්නේ කෙසේද?

සාක්ෂරතා සහ අංක ශාස්ත්‍ර ක්ෂේත්‍රයන්හි සිසුන් ඉගෙන ගත් දේවල් විදහා දැක්වීමට NAPLAN පරීක්ෂණය මගින් ඔවුන්ට අවස්ථාවක් ලබා දෙයි. ප්‍රත්‍යෙක ශිෂ්‍ය ප්‍රතිඵල මගින් තම දරුවා කියවීම, ලිවීම, අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ හා විරාම ලකුණු, සහ සංඛ්‍යා පරීක්ෂණ වලදී ක්‍රියා කළ ආකාරය දෙමව්පියන්ට / රැකබලා ගන්නන්ට පෙන්වා දෙයි.

ඔබේ දරුවා ලබාගත් ප්‍රතිඵල පන්තියේ ළමයින් ලබාගත් ප්‍රතිඵල සමඟ පමණක් නොව සියලුම සිසුන් ලබාගත් ප්‍රතිඵල සමඟ සංසන්දනය කෙරේ. දෙමාපියන්ට සහ සිසුන්ට ඔවුන්ගේ ශිෂ්‍ය ප්‍රගතිය පිළිබඳව ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමට NAPLAN ප්‍රතිඵල උපකාරී විය හැකිය. NAPLAN පරීක්ෂණය 3, 5, 7 සහ 9 යන වසර වලදී ඔබේ දරුවාගේ ප්‍රගතිය නිරීක්ෂණය කරන හෙයින්, එය සිසුන්ගේ සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධ සාධනයේ වර්ධනය පිළිබඳ විෂයබද්ධ තොරතුරු සපයයි.

## ප්‍රතිඵල මගේ දරුවාගේ අනාගතයට බලපාන්නේ කෙසේද?

NAPLAN ප්‍රතිඵල මගින් ඔබේ දරුවා ඔවුන්ගේ සාමාන්‍ය පාසල් විෂය මාලාව තුළින් ඉගෙන ගන්නා සාක්ෂරතා සහ අංක ශාස්ත්‍ර කුසලතා පිළිබඳ වැදගත් තොරතුරු සපයයි. මෙම ප්‍රතිඵල ඔබේ දරුවා පාසලේදී කරන අනෙක් ඇගයීම් වලට අනුපූරක වේ. එමගින් ඇගයීම් කරන අවස්ථාවේ දී ඔබේ දරුවා ලබාගත් ප්‍රතිඵල සහ දරුවාගේ ප්‍රගතිය පිළිබඳ අවබෝධයක් ඔබට සහ ඔබේ දරුවාගේ ගුරුවරුන්ට ලබා දෙයි. ඔබේ දරුවාට පූර්ණ හැකියාවන් කරා ළඟාවීම සඳහා උපකාරී වීමට මෙම තොරතුරු භාවිතා කළ හැකිය.

සිසුන් පාසලට ඇතුළත් වීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සමහර පාසල්, පාසල් වාර්තා වලට අමතරව NAPLAN වාර්තා ඉල්ලා සිටිය හැකිය. NAPLAN ඇගයීම් සැලසුම් කර ඇත්තේ පාසල් ඇතුළත් කිරීමේ පරීක්ෂණයක් ලෙස නොවේ. කෙසේ වෙතත්, සිසුන්ගේ අවශ්‍යතා පිළිබඳව නව පාසලක් වෙත දැනුම් දීම සඳහා එම ඇගයීම්වල ප්‍රතිඵල ප්‍රයෝජනවත් විය හැකිය. ඔබ සැලකිලිමත් වන කිසියම් කරුණක් ඇත්නම්, ඒවා පාසල සමඟ සාකච්ඡා කිරීමට ACARA ඔබව දිරිමත් කරයි.

## NAPLAN පරීක්ෂණය මගේ පාසලට උපකාරී වන්නේ කෙසේද?

ඕස්ට්‍රේලියානු ළමුන් පෙනී සිටින එකම ජාතික ඇගයීම පරීක්ෂණය NAPLAN වේ. NAPLAN පරීක්ෂණය පහත සඳහන් ආකාරයට උපකාරී වේ:

- ගුරුවරුන්ට වැඩි අභියෝගයන් හෝ අමතර උදව් අවශ්‍ය සිසුන් වඩා හොඳින් හඳුනා ගැනීමට
- පාසල්වලට ඉගැන්වීමේ වැඩසටහන්වල හැකියාවන් සහ අවශ්‍යතා හඳුනා ගැනීමට
- පාසල්වලට සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධව ඉලක්ක සකස්කර ගැනීමට
- පාසල් පද්ධතියට වැඩසටහන් සහ පාසල් සඳහා ලබා දෙන සහාය සමාලෝචනය කිරීමට
- ප්‍රජාවට *My School* වෙබ් අඩවිය වෙතින් පාසල් පොදු ප්‍රතිඵල දැක ගැනීමට

NAPLAN පරීක්ෂණය වෙනත් පාසල් ඇගයීම් අනුපූරණය කරයි. එමෙන්ම අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය සහ සිසුන් වැදගත් සාක්ෂරතා හා අංක ශාස්ත්‍ර ප්‍රමිතීන් සපුරාලන්නේද යන්න තක්සේරු කිරීමට රජයන්ට උපකාර කිරීම සඳහා ජාතික වශයෙන් සැසඳිය හැකි දත්ත සපයයි.

## වෙනත් කෙනෙක් ප්‍රතිඵල දකින්නේ ද?

සෑම වසරකම, පරීක්ෂණ පරිපාලන බලධාරීන් NAPLAN පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් සඳහා ඔවුන්ගේ ප්‍රතිඵල පාසල් වෙත ලබා දෙති. පාසල පුරා වැඩිදියුණු කිරීම් සඳහා යොදා ගන්න සැලසුම් පිළිබඳව දැනුම් දීම සඳහා මෙම ප්‍රතිඵල භාවිතා කිරීමට පාසල් දිරිමත් කරනු ලැබේ. ප්‍රත්‍යෙක ශිෂ්‍ය වාර්තා රහස්‍ය ය. ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරියෙන් හෝ ඔබේ පාසලෙන් පිටත කිසිවෙකු ඔබේ දරුවාගේ වාර්තාව දැකගැනීමට නොලැබෙනු ඇත.

පාසලේ මධ්‍යක ප්‍රතිඵල *My School* වෙබ් අඩවිය (www.myschool.edu.au). ප්‍රසිද්ධියේ වාර්තා කරයි. සෑම වසරකම පළමු කාර්තුවේ දී, පෙර වර්ෂයේ ප්‍රතිඵල ඇතුළත්කර වෙබ් අඩවිය යාවත්කාලීන කරයි. එක් එක් පාසලේ පැතිකඩෙහි අංගයන් සලකා බැලීමට මෙන්ම සමාන ශිෂ්‍ය ජනගහනයන්ට සේවා සපයන පාසල් සමඟ සැසඳීම් කිරීමට *My School* මගින් ප්‍රජාවට ඉඩ සලසයි. ඔබේ දරුවාගේ ප්‍රත්‍යෙක ප්‍රතිඵල *My School* වෙතින් ලබාගත නොහැකිය.

## මා සහ මගේ දරුවා බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබුනහෙත් කුමක් කළ හැකිද?

NAPLAN පරීක්ෂණ සාක්ෂරතාවයේ සහ අංක ශාස්ත්‍රයේ ඉගෙනීම් ප්‍රගතිය ඇගැයීමට ලක් කරති. එක් එක් පරීක්ෂණය සඳහා ඇගයීම් පරිමාණයේ ඔවුන්ගේ ප්‍රතිඵල පිහිටා ඇති ස්ථානය පිළිබඳ ඇඟවීමක් සිසුන්ට ලබා දෙයි. NAPLAN ප්‍රතිඵල සියලු සිසුන් අතර හා කාලයත් සමඟ ජාතික වශයෙන් සැසඳිය හැකි අතර, පරීක්ෂණ දිනයේ දී සිසුවෙකු මුහුණදෙන අත්දැකීම් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයට බලපෑම් සිදුකල හැකිය.

ඔබේ දරුවාගේ NAPLAN ප්‍රතිඵල පිළිබඳව යම් ප්‍රශ්නයක් සැලකිලිමත්වන කරුණක් ඔබට ඇත්නම්, ඔබේ දරුවාගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳ හොඳම අවබෝධය ඇති දරුවාගේ ගුරුවරයා සමඟ ඔබ මේවා සාකච්ඡා කළ යුතුය.

NAPLAN පරීක්ෂණය සහ / හෝ මාර්ගගතව ප්‍රවේශය පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා, www.nap.edu.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න